සැ. යු. - 2009.04.17 දින පළ වූ අංක 1,598 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,599 - 2009 අප්‍රේල් මස 24 වැනි සිකුරාදා - 2009.04.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 548 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 549 |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 550 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 553 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

සැ. යු.- (i) ග්ලෝබල් හියුමනිටේරියන් ෆවුන්ඩේෂන් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2008, නොවැම්බර් මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

(ii) මහින්දානන්ද අළුත්ගමගේ පදනම (සංශෝධන කිරීමේ) පනත් කෙටුම්පත 2008, දෙසැම්බර් මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

(iii) සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2009, ජනවාරි මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 අප්‍රේල් මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 අප්‍රේල් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

547 - B 080007— 9,115 (2009/04)

# බඩු බාහිරාදිය විකිණීම්

## සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය - මැදවච්චිය

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ, හිමිකම් නොපාන ලද, නඩු අංක මැකී ඇති, නඩු වාර්තා සොයා ගැනීමට අපහසු, නඩු අංක සොයා ගැනීමට අපහසු, භාණ්ඩවල අංක මැකී ඇති පහත සඳහන් භාණ්ඩ 2009.05.16 වැනි සෙනසුරාදා දින පෙ. ව. 9.30 ට මැදවච්චිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් දක්වන්නේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර හෝ එදින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසි දින නියමිත වේලාවට පැය 1/2කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව පිළිනොගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ එවෙලේ ම මුදල් ගෙවා ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ සඳහා ගැණුම්කරු විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

07. වෙන්දේසිය පිළිබඳව පැමිණිලි කිසිවක් වෙතොත් එදින වෙන්දේසියේ රාජකාරි අවසන් වීමට පෙර අධිකරණය වෙත දැන්විය යුතු අතර, ඊට පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

08. මෙම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳව සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බව ද වැඩිදුරටත් සඳහන් කරමි.

රුචිර වැලිවත්ත,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
අනුරාධපුරය.

2009 පෙබරවාරි මස 25 වැනි දින,
අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| 01. | 65181 | වයර් මීටර් 70 පමණ අඩංගු රෝල් එකයි |
| 02. | 65182 | වයර් මීටර් 25 පමණ අඩංගු රෝල් එකයි |
| 03. | 65183 | වයර් මීටර් 20 පමණ හා බල්බ් එකක් හා හෝල්ඩර් එකක් අඩංගු පාර්සල් එකයි |
| 04. | අංක රහිත | වයර් මීටර් 50 බහු පේනු 02යි |
| 05. | අංක රහිත | වයර් මීටර් 04 බහු පේනු එකයි |
| 06. | අංක රහිත | වයර් මීටර් 250 පමණ අඩංගු රෝල් එකයි |
| 07. | අංක රහිත | වයර් මීටර් 200 පමණ අඩංගු රෝල් එකයි |
| 08. | 65958 | වයර් මීටර් 20 පමණ අඩංගු රෝල් එකයි |
| 09. | 65959 | වයර් මීටර් 15 පමණ අඩංගු රෝල් එකයි |
| 10. | 67548 | උදලු 01යි, සවල් 01යි |
| 11. | 64450 | කැති 01යි, පොරෝ 02යි |
| 12. | 63833 | පොරෝ 2යි, අලවංගු එකයි, බූලි 02යි |
| | 63833 | කොහු කඹ එකයි |
| 13. | 67574 | උදලු 01යි |
| | 67576 | සවල් 01යි |
| 14. | 78597 | තරාදි එකයි |
| | 78597 | කිලෝ ග්‍රෑම් 1 පඩි එකයි |
| 15. | 78579 | උදලු එකයි |
| | 78579 | සවල් එකයි |
| 16. | 62187 | සවල් 02යි |
| 17. | 62186 | සවල් 01යි |
| 18. | 66278 | සවල් 01යි |
| | 66278 | උදලු 01යි |
| 19. | 63265 | දිග කියත් 01යි |
| 20. | 63265 | බන්ඩි කියත් 01යි |
| | | පොරව 01යි |
| | 63265 | හුළං පොම්ප 01යි |
| 21. | 39112 | පොරව 01යි |
| 22. | 39113 | කුඩා යතු කැට 01යි |
| | 39113 | නියන් 01යි |
| | 39113 | අත් කියත් 01යි |
| | 39313 | මුගු මට්ටම් 01යි |
| | 39313 | කරාම 01යි |
| 23. | 62188 | ග්‍රයින්ඩර් 01යි |
| | 62188 | අත් කියත් 01යි |
| | 62188 | නියන් 01යි |
| | 62188 | වරන්කල 01යි |
| | 62188 | මුගු මට්ටම් 01යි |
| | 62188 | දිග අත් යතු 01යි |
| 24. | 32481 | යතු කැට 02යි |
| | 32482 | අත කොලු 03යි |
| | 32483 | වරන්කල 02යි |
| | | නියන් 03යි |
| 25. | 78339 | උදලු 01යි |
| | | පිකස් 01යි |
| | | කටු 01යි |
| 26. | 78339 | කුළු ගෙඩි 01යි |
| | | අලවංගු 01යි |
| 27. | 78339 | ටෙන්ට් රෙදි 01යි |
| | | කඹ 01යි |
| 28. | 78339 | කුඩා ජෝගු 02යි |
| | | ප්ලාස්ටික් පිඟන් 03යි |
| | | ප්ලාස්ටික් දීසි 02යි |
| | | තාච්චි 03යි |
| | | නැඹිලි 01යි |
| | | මුට්ටි 02යි |
| | | බෝතල් 01යි |
| | | හැඳි 01යි |
| 29. | ඒ 335/08 | ඩීසල් 30 L අඩංගු බූලි 01යි |
| 30. | ඒ 335/08 | ඩීසල් 25 L අඩංගු බූලි 01යි |
| 31. | අංක රහිත | හිස් බූලි 05යි |

| අනු අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| 32. | අංක රහිත | හිස් බූලි 05යි |
| 33. | අංක රහිත | හිස් බූලි 05යි |
| 34. | අංක රහිත | හිස් පොඩි බූලි 10යි |
| 35. | අංක රහිත | හිස් පොඩි බූලි 10යි |
| 36. | අංක රහිත | හිස් පොඩි බූලි 10යි |
| 37. | අංක රහිත | පොඩි බැරල් 02යි හිස් බූලි 02යි |
| 38. | අංක රහිත | හිස් බෝතල් 250යි |
| 39. | අංක රහිත | හිස් බෝතල් 250යි |
| 40. | අංක රහිත | හිස් බෝතල් 250යි |
| 41. | අංක රහිත | අබලන් යතුරුපැදි 01යි |
| 42. | අංක රහිත | අබලන් යතුරුපැදි 01යි |
| 43. | 11662 | හොන්ඩා වර්ගයේ අබලන් යතුරු පැදි 01යි |
| 44. | 59993 | ස්පෝට් මාදිලියේ පාපැදි 01යි |
| 45. | ඒ 369/08 | අංක 201-0032 බජාජ් වර්ගයේ ත්‍රිරෝද රථය |
| 46. | 66639 | බහු කාර්ය වඩු මැෂින් 01යි |
| 47. | බී 2700/05 | රවුම් කියත් තලය සහිත ඉරුම් බංකු 01යි |
| 48. | 63265 | අත් කියත් 01යි |
| 49. | බී 14/2004 | රවුම් කියත් තලය සහිත ඉරුම් බංකු 01යි |
| 50. | අංක රහිත | ඉරුම් බංකු 01යි |
| 51. | බී 1237/08 | ගල් කටු 04යි |
| 52. | බී 1237/08 | ගල් කටු 04යි |
| 53. | බී1237/08 | ගල් කටු 04යි |
| 54. | බී 1237/08 | ගල් කටු 05යි |
| 55. | බී 1237/08 | ගල් කටු 07යි |
| 56. | බී 1237/08 | කුළු ගෙඩි 01යි, මිටි 01යි |
| 57. | බී 1237/08 | කුළු ගෙඩි 01යි, මිටි 01යි |

| අනු අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| 58. | බී 1237/08 | බොලොක්ක 01යි |
| 59. | බී 1237/08 | කොක්ක සහිත දම්වැල් 01යි |
| 60. | බී 1237/08 | අලවංගු 01යි, කටු 01යි |
| 61. | බී 1237/08 | නාරාසන එකයි, කටු 01යි |
| 62. | බී 1237/08 | බාල්දි 02යි |
| 63. | බී 1237/08 | අඩි 66 දිග වයර් සහිත හැන්ඩ් ග්‍රයින්ඩර් 01යි |
| 64. | බී 1237/08 | ගයිඩර් තල 02යි, කටර් අඬු 01යි, මල් ස්කුරුප්පු නියන් 01යි |
| 65. | බී 1237/08 | ටොමෝයාටා එන්. එල්. 2500 සී. එන්. වර්ගයේ ජෙනරේටර් 01යි |
| 66. | බී 1237/08 | සාස්පාන් 02යි |
| | | කොරස් 01යි |
| | | නෑඹිලි 01යි |
| | | අත් හිරමන 01යි |
| | | ප්ලාස්ටික් පිඟන් 05යි, හිස් බූලි 01යි, මන්නා පිහි 01යි |
| 67. | 66855 | ලී ඉරීමට ගන්නා චෙන්සෝ 01යි |
| 68. | 81913 | 2kg පඩි 01යි |
| | 81914 | 1kg පඩි 05යි |
| | 81916 | 500g පඩි 01යි |
| | 81917 | 200g පඩි 03යි |
| | 81919 | |
| | 81920 | |
| | 81921 | |

04-515

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

මගේ අංකය : ආර්/ආ/04/08/01.

**ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2009/2010 වර්ෂය

***2009 ජූලි සිට 2010 ජුනි දක්වා***

2009 ජූලි මස 01 දින සිට 2010 ජුනි මස 30 දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරා බදු බලපත්‍රයක් ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත් ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක .................................. රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2009.05.21 වැනි දින පෙ. ව. 10.00 ට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා 1982.08.20 දින පළ වී ඇති අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2009.05.21 වැනි දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ තැබෑරුම් සඳහා නැවත විකිණීම 2009.06.04 දින පෙ. ව. 10.00 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම යථොක්ත ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඒ. එම්. ආර්. ජේ. කේ. ජයසිංහ,(වැ. බ.)
ප්‍රාදේශීය ලේකම්, ආරච්චිකට්ටුව.

*උපලේඛනය*

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැම්පත් කළ මුදල රු.* |
|---|---|---|---|---|
| ආනවිලුන්දන් | කරුකුපනේ | 10 | 2009.05.21 | 250 0 |
| ආනවිලුන්දන් | ආරච්චිකට්ටුව | 11 | පෙ. ව. 10.00 ට | 250 0 |
| ආනවිලුන්දන් | බත්තුලුඔය | 12 | | 250 0 |

04-544

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටර්නි බලය අහෝසි කොට ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

නුගේගොඩ, කොහුවල, මල්වත්ත පාරේ, අංක 11/1 හි පැටිකිරිය ආරච්චිගේ දොන් සරණපාල වන මා විසින් නුගේගොඩ, කොහුවල, මල්වත්ත පාරේ අංක 11/1 හි ජයසූරිය ආරච්චිගේ රෝෂාන් මංගල පෙරේරා යන අය වෙත පවරන ලද, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නලින්ද ප්‍රේමචන්ද්‍ර මහතා විසින් සහතික කරන ලද, 1999 ජූලි 17 දිනැති අංක 94 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අහෝසි කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත් මින් ඉදිරියට ඉහත නම් සඳහන් ජයසූරිය ආරච්චිගේ රෝෂාන් මංගල පෙරේරා යන අය විසින් ඉහත කී ඇටර්නි බලපත්‍රය ප්‍රකාරව මාගේ නමින් හෝ මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සඳහා මාගේ කිසිදු වගකීමක් නොමැති බවත් මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

2009 මාර්තු මස 26 වැනි දින, කොළඹ දී ය.

04-518

## සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2009.03.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි තම සමාගම් නාමය වෙනස් කළ බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පෙර නාමය : ටෙක් ඩිස්ට්‍රිබියුෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 9020
ලියාපදිංචි ලිපිනය : 16 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01
සමාගමේ නව නාමය : ටෙක් වන් ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ්

බී ඩී ඕ බිස්කොන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 65/2,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

04-522

## ප්‍රසිද්ධ දැන්වීම

### ඒකාබද්ධ කිරීම

**ද ස්වදේශී ඉන්ඩස්ට්‍රියල් වර්ක්ස් පී එල් සී සමාගම් අංක පී. කියු. 133**
**ද ස්වදේශී හර්බල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අංක පී. වී. 3897**

2007 වර්ෂයේ අංක 7 දරන සමාගම් පනතේ (පනත) 242 (3) බී වගන්තිය ප්‍රකාර, පීකිව් 133 දරන සමාගම් අංකය යටතේ සංස්ථාපිත ගත කරන ලදී. 'ද ස්වදේශී ඉන්ඩස්ට්‍රියල් වර්ක්ස් පී එල් සී.' නමැති සමාගම සහ අංක පීවී 3897 සමාගමේ අංකය යටතේ සංස්ථාපිත ගත කරන ලද, 'ද ස්වදේශී හර්බල් (ප්‍රයිවට්) ලිමිටඩ් ' සමාගම එකී පනතේ 242 වගන්තිය ප්‍රකාර එකම අස්තිත්වයක් ලෙස ඒකාබද්ධ කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒකාබද්ධ කරන ලද සමාගමේ නම 'ද ස්වදේශී ඉන්ඩස්ට්‍රියල් වර්ක්ස් පීඑල්සී' වන අතර මෙකී ඒකාබද්ධ කිරීම් වර්ෂ 2009 ක් වූ මැයි මස 29 වැනි දින හෝ සමාගමේ රෙජිස්ට්‍රාර් ජෙනරාල් විසින් අනුමත කරන දින සිට ක්‍රියාත්මක වනු ඇත.

ඒකාබද්ධ කරන ලද, 'ද ස්වදේශී ඉන්ඩස්ට්‍රියල් වර්ක්ස් පීඑල්සී' සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 01, සර් බාරොන් ජයතිලක මාවතේ, ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්ඩියා ගොඩනැගිල්ලේ, අංක 18-2/1 ඒ හි පිහිටුවනු ලැබේ.

මණ්ඩලයේ නියෝගය පරිදි,

එකවුන්ටිං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-523

---

**2007 අංක 07 දරන සමාගම් පනත**

ඩී ඇන්ඩ් එන් ඩිස්ට්‍රිබියුෂන් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
පී. වී. 67403

ඉහත සඳහන් සමාගම 2009 මාර්තු විසිහතර වන දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 548 බී, නාවල පාර, රාජගිරිය ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමු.

බිස්නස් ඇන් ඉන්ඩස්ට්‍රියල් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 65/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

04-525

---

**දැන්වීම**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) උප වගන්තියේ නියමයන් යටතේ කරනු ලබන සංස්ථාපිත සමාගමේ විස්තර දැන්වීම

සමාගමේ නම : සීමාසහිත ස්නෝමෙන් ග්‍රෑප් (පෞද්ගලික)
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 66740
ලියාපදිංචි ප්‍රධාන කාර්යාලයේ ලිපිනය : වැල්ලඹඩය, කහන්දාව, රන්න

(සමාගමේ අධ්‍යක්ෂ චන්දන කුමාර ද සිල්වා සන්දරාදුර මහතා විසින් ප්‍රසිද්ධ කරනු ලැබේ.)

04-532

---

**ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම ලියාපදිංචි කරන ලදි.

සමාගමේ නම : ඔරැක් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 67376
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 45 ඒ, කනත්ත පාර, තලපත්පිටිය, නුගේගොඩ.

සමාගම් ලේකම්.

04-533

---

**ඇටර්නි බලය අවලංගු කිරීම**

රත්නපුර, වේවැල්වත්ත, කඳුරුගලවත්ත, 'සම්පත්' හි පදිංචි හැඩකන්දේ කිරිබබාලාගේ සිරිසේන වන මගේ ඇටර්නි බලකරු ලෙස රත්නපුර, වේවැල්වත්ත, කඳුරුගලවත්ත 'සම්පත්' හි පදිංචි අලුත්ගේ ජයවතී හෙවත් ජයවතී අළුත්ගේ යන අය පත් කරමින් ප්‍රසිද්ධ නොතාරිස් එච්. පී. තිලකරත්න මහතා සහතික කළ අංක 99 හා 2007.12.19 දින දරන ඇටර්නි බලය මෙයින් අවලංගු කර, ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලද බව මෙයින් දැනුම් දෙමි.

ඉහත සඳහන් අය මාගේ ඇටර්නි බලකරු ලෙස මා වෙනුවෙන් කරන කිසිදු ක්‍රියාවකට මින් ඉදිරියට මම වග නොකියන බවත් ප්‍රකාශ කරමි.

04-543

---

**2007 අංක 07 දරන සමාගම් පනතේ 11 (5) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

කොන්ට්පිප් ඒජන්සීස් ලිමිටඩ් හි කොටස් හිමියන් විසින් 2009.04.15 දින සම්මත කරන ලද යෝජනාවකට අනුව සීමාසහිත පොදු සමාගමක් වශයෙන් පැවතුන ඉහත සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් බවට පත් කිරීමට ද ස්වකීය සමාගම් නාමය කොන්ට්පිප් ඒජන්සීස් ප්‍රයිවට් ලිමිටඩ් යනුවෙන් වෙනස් කිරීමට සහ ඉහත වෙනස්කම්වලට අනුකූලව නව ව්‍යවස්ථාවලියක් සම්මත කර ගැනීමට ද ඒකමතිකව තීරණය කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මැක්ලරන්ස් හෝල්ඩින්ග්ස් ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-557

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හංවැල්ල, ඉහළ හංවැල්ල හි පදිංචි රත්නසිරි රූපසිංහ (ජාතික හැඳුනුම්පත් අංක 533161480 වී) වන මම, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජයන්ත ආර්. දොලවත්ත විසින් වර්ෂ 1991.04.24 වැනි දින ලියා සහතික කළ අංක 78 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් එකී ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ බුත්පිටිය , කිනිගම 'වික්‍රම' හි පදිංචි ඉන්ද්‍රානි පුෂ්පලතා රූපසිංහ (විවාහයට පෙර වික්‍රමආරච්චි) නමැති අයට ලබා දුන් ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලැබූ බව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ සියලු මහජනතාවටත් අන් සියලු දෙනාත් මෙයින් දැන ගනිත්වා.

එකී ඇටෝර්නි බලපත්‍රයේ සඳහන් ඇටෝනි බලකරු විසින් මෙදිනෙන් පසු මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ කිසිදු ගණුදෙනුවක් සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් භාර ගනු නොලබන බව ද සියලු දෙනාම මෙයින් දැන ගනිත්වා.

රත්නසිරි රූපසිංහ.

2009 අප්‍රේල් මස 07 වැනි දින.

04-556

---

### දැන්වීම

2007 ව්‍යාපාර නාම ආඥාපනතේ 07 වැනි වගන්තියේ 9 පරිච්ඡේදයේ (1) කොටසට අනුකූලව පහත දැක්වෙන ව්‍යාපාරය සංස්ථාවක් ලෙස ලියාපදිංචි කළ බව මෙම දැන්වීමෙන් දන්වා සිටිනු ලැබේ.

1. ව්‍යාපාරයේ නම : යුරෝනිපෝන් ප්ලාන්ටේෂන්ස් (පුද්) සමාගම
2. ලියාපදිංචි කළ දිනය : 2009 අප්‍රේල් 02 වැනි දින
3. ව්‍යාපාර අංකය : පීවී 67489
4. ලියාපදිංචි ලිපිනය : අංක 262, ගාලු පාර, තල්පිටිය උතුර, වාද්දුව.

ලේකම්,
එකවින්ටින් ඇන්ඩ් අලයිඩ් සර්විසර්ස් (පුද්.) සමාගම.

2009 අප්‍රේල් මස 02 වැනි දින.

04-589

---

### දැන්වීම

2007 ව්‍යාපාර නාම ආඥාපනතේ 07 වැනි වගන්තියේ 9 පරිච්ඡේදයේ (1) කොටසට අනුකූලව පහත දැක්වෙන ව්‍යාපාරය සංස්ථාවක් ලෙස ලියාපදිංචි කළ බව මෙම දැන්වීමෙන් දන්වා සිටිනු ලැබේ.

1. ව්‍යාපාරයේ නම : සීගල් ග්‍රීන් රිසෝට් (පුද්) සමාගම
2. ලියාපදිංචි කළ දිනය : 2009 අප්‍රේල් 02 වැනි දින
3. ව්‍යාපාර අංකය : පීවී 67500
4. ලියාපදිංචි ලිපිනය : අංක 474/4, ගාලු පාර, කොළඹ 03

ලේකම්,
එකවින්ටින් ඇන්ඩ් අලයිඩ් සර්විසර්ස් (පුද්.) සමාගම.

2009 අප්‍රේල් මස 02 වැනි දින.

04-588

---

### දැන්වීම

2007 ව්‍යාපාර නාම ආඥාපනතේ 07 වැනි වගන්තියේ 9 පරිච්ඡේදයේ (1) කොටසට අනුකූලව පහත දැක්වෙන ව්‍යාපාරය සංස්ථාවක් ලෙස ලියාපදිංචි කළ බව මෙම දැන්වීමෙන් දන්වා සිටිනු ලැබේ.

1. ව්‍යාපාරයේ නම : පලිපාන හයිඩ්‍රොලික් ඉන්ජිනියරිං (පුද්) සමාගම
2. ලියාපදිංචි කළ දිනය : 2009 අප්‍රේල් 02 වැනි දින
3. ව්‍යාපාර අංකය : පීවී 67490
4. ලියාපදිංචි ලිපිනය : 38/1/5, වෑකඩ පාර, මාලපල්ල, හෝමාගම

ලේකම්,
එකවින්ටින් ඇන්ඩ් අලයිඩ් සර්විසර්ස් (පුද්.) සමාගම.

2009 අප්‍රේල් මස 02 වැනි දින.

04-587

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : සමගි කොන්ක්‍රීට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය: පී. වී. 67395
ලියාපදිංචි දිනය: 2009.03.24
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 118, ගාලු පාර, හේනමුල්ල.
පානදුර.

සමාගම් ලේකම්වරු,
කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්) සමාගම.

04-553

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

එක්සත් රාජධානිය, එස්2 3ජීඑස්, හීලි ෂෙෆීල්ඩ්, උතුරු ආන්ස් පාර, අංක, 149 හි පදිංචි ජයන්ති ඇතුලත්මුදලි සිල්වා වන මා විසින් මොරටුව, අඟුලාන දුම්රිය පාර, 2 වැනි පටුමග, අංක 30/10 දරන තැන පදිංචි පුෂ්පා ශ්‍රීමතී කාරියවසම් යන අය වෙත ප්‍රදානය කරන ලද වර්ෂ 2001 ක්වූ අප්‍රේල් මස 11 වැනි දින මිඩ්ල්සෙක්ස්, එච්ඒ9 7ඒබී, වෙම්බ්ලි හි සොලිසිටර්වරු වන ගුරුසිංහ සහ සමාගම ඉදිරියේ දී අත්සන් කරන ලද ඇටර්නි බලපත්‍රය වහාම බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන බවත්, එකී පුෂ්පා ශ්‍රීමතී කාරියවසම් යන අය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මින් ඉදිරියට මා වග නොකියන බවත් ඒ හා සම්බන්ධ කිසිදු වගකීමකට නොබැඳෙන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජයන්ති ඇතුලත්මුදලි සිල්වා.

04-583

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. -තලවතුගොඩ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංකය පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර,ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

බලයලත් මානක නලින් හේරත් විසින් 2005 අගෝස්තු මස 17 වැනි දින සාදන ලද අංක 2005/354 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේපත්තු හේවාගම් කෝරළේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ තලවතුගොඩ පිහිටි මිල්ලගහලන්ද සහ ආන්දුරුවානගහකනත්ත ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 23 ඒ දරන

පර්චස් විස්සක් (අ. 0 රූ. 0 ප. 20) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ සියළුදේත් සමග වේ.

ත්‍රී මයින්ඩ් ෆුඩ් ප්‍රොසසිංග් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට ද, ඔහු විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ, 2009 මැයි මස 15 වැනි දින පෙ. ව. 11.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2008.12.05 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2008.12.10 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ වීරකේසරි පුවත්පත් බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2009.04.24 වන දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2009.04.28 වැනි දින දිවයින සහ ද අයිලන්ඩ් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.-* තලවතුගොඩ මංසන්දියේ සිට හෝකන්දර පාරේ මීටර් 300 ක් පමණ රුහුණුපුර මාවත දක්වා ගොස් එම පාරේ මීටර් 350 ක් පමණ ගිය විට මෙම දේපළ දකුණු පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (01%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ තලවතුගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතු යි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, සහ උසාවි කොමසාරිස්, කොළඹ
වාණිජ මහාධිකරණය සහ දිසා අධිකරණය, බලයලත්
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන/ෆැක්ස් ፡ 011 2445393.

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංකඃ 7, සුරම්‍යා ගොඩනැගිල්ල,
කෝට්ටේ පාර,
තලවතුගොඩ.
දුරකථන අංකය ፡ 011 2773152,
ෆැක්ස් අංකය ፡ 011 2773553.

04-592

**ඩීඑෆ්සීසී බැංකුව**
**(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 995 සහ 1718 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, යටිපළාත කෝරළේ, ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වැවගෙදරගම ලුණුවත්තෙහි පිහිටා ඇති ගිණිකටුකැලේ හෙවත් ගිණිකටුගල ලෙස හැඳින්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම් කැබලි දෙක මෙසේ සඳහන් කර ඇත.

බලයලත් මිනින්දෝරු අයි. කොටැඹගේ විසින් සකසන ලද 2005 දෙසැම්බර් මස 28 වැනි දිනැති අංක 965 දරන පිඹුරු පතෙහි ලොට් අංක 1 සහ 2 ලෙස විස්තර කර ඇත.

***ඉඩමේ ප්‍රමාණය :*** *ලොට් අංක* 1 : අ. 0, රූ. 0, පර්. 28.50,
*ලොට් අංක* 2 : අ. 0, රූ. 1, පර්. 4.70 එහි පිහිටි සියල්ල සහිතව.

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. එච්. මැණිකේ විසින් ලියා සහතික කරන ලද 2006 ජනවාරි මස 04 වැනි දින දාතමින් යුතු අංක 995 දරන උකස්කරය සහ 2006 දෙසැම්බර් මස 06 වැනි දින දාතමින් යුතු අංක 1718 දරන උකස්කරය ප්‍රකාර ලුණුවත්ත පදිංචි ආරච්චි පතිරණගේ අසේල ඉන්ද්‍රානන්ද විසින් ඩී. එෆ්. සී. සී. බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී. එෆ්. සී. සී. බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 මැයි මස 14 වැනි (බ්‍රහස්පතින්දා) දින පෙ. ව. 11.00ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීම් ක්‍රමය.-* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

01. ගැණුම් මිළෙන් 10%ක් (සියයට දහයක්),
02. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
04. රු. 38,500ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
05. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500.00,
06. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී. එෆ්. සී. සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න.

දුරකථන අංක : 011-2440366/77

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 : 2000 සහතිකය ලත්
ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 5.
දුරකථන අංක : 011-2502680, 011-2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් : schokman@samera1892.com

*වෙබ් අඩවිය :* www.schokmanandsamerawickreme.com

04-590

---

**රුහුණ සංවර්ධන බැංකුව - කැකණඳුර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපළ 2009.06.03 වැනි දින පෙ. ව. 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ, තලල්ලේ පිහිටි, කොරදමනියවත්තේ බෙදා වෙන් කළ අංක 01 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු එන්. විජේවීර මහතා විසින් මැන සාදන ලද අංක 4708 හා 1993.10.31 දරන පිඹුරේ බෙදා වෙන් කළ අංක 33 දරන පර්චස් දහයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 10.5)ක් විශාල ඉඩම හා ඒ තුළ පිහිටි සියළු වැවිලි හා ගොඩනැගිලි ද ඉහත කී සැළැස්මේ පාර සඳහා වෙන් කළ බිම් තීරුව පාරක් වශයෙන් පාවිච්චි කිරීමේ අයිතිය ද වේ.

වැඩි විස්තර සඳහා 2008.12.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.02.10 වැනි දින දිනමිණ, තිනකරන් හා දි අයිලන්ඩ් යන පුවත්පත්වල ද පළකර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.-* තලල්ල උතුර පාසල අසළින් වැටී ඇති ලක්සිරි උයන පාරේ වෙන්දේසි වත්තේ රේල් පාර පසුකර මී. 50ක් ඉදිරියට ගිය පසු වම් පසට ඇති පාරේ 03 වැනි නිවස හා ඉඩම වේ.

*ගෙවීම් ක්‍රමය.-* වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතු ය :-

01. ගැණුම් මිළෙන් 25%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2 ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ, අංක 382ඒ දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරිතුමාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාල මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209, 041-2264457

ජී. පී. ආනන්ද,
සාම විනිසුරු බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම,
මාතර.
දුරකථන අංක : 041-2228731, 071-4438516

04-520/1

---

**රුහුණ සංවර්ධන බැංකුව - වැලිගම ශාඛාව**

**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම**

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපළ 2009.06.01 වැනි දින පෙ. ව. 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, මිදිගම, විලේගොඩ පිහිටි මාදම්පාවත්ත නමැති ඉඩමේ බෙදා වෙන් කළ අංක 03 දරන කැබැල්ල බලයලත් මිනින්දෝරු එන්. විජේවීර මහතා විසින් මැන සාදන ලද අංක 5536 හා 1997.07.02 දිනැති පිඹුරේ පෙන්වා ඇති අංක 03ඒ දරන පර්චස් තිස් පහක් විශාල ඉඩම හා ඒ පිහිටි සියළු වැවිලි සහ ගොඩනැගිලි ද සමග වේ.

වැඩි විස්තර සඳහා 2009.01.09 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.02.20 වැනි දින දිනමිණ, තිනකරන් හා ද අයිලන්ඩ් යන පුවත්පත්වල ද පළකර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.-* වැලිගම, ඉබ්බාවල හරහා ඉමදුව මාර්ගයේ ඉබ්බාවල පාසල් හන්දියෙන් දකුණට ඇති රණමයුරගම, විලේගොඩ සිට කි. මී. 01ක් පමණ දුර යන විට විලේගොඩ මාදම්පාවත්ත නමැති මෙම දේපළ පාරේ වම්පස පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය.-* වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය :-

01. ගැණුම් මිළෙන් 25%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2 ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382ඒ දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරිතුමාට ගෙවිය යුතු ය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාල මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209, 041-2250166.

ජී. පී. ආනන්ද,
සාමවිනිසුරු, බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම,
මාතර.
දුරකථන අංක : 041-2228731
071-4438516

04-520/2

### ලංකා බැංකුව

ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.02.27 වැනි දිනැති අංක 1591 දරන ගැසට් පත්‍රයේ හා 2009.02.19 දිනැති ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේ දීම 2009.05.23 වැනි දින පෙ. ව. 11.30ට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව් හි පදිංචි වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ (මාකොළ උප කාර්යාලය) ගෝනවල පිහිටි, කොස්කුඹුර පාරේ, වරිපනම් අංක 40/15 දරන ගොරකගහවත්ත නොහොත් දෙල්ගහවත්ත දෙල්ගහකනත්ත, කොස්කුඹුරේ පිල්ලෑව, කොස්කුඹුරේ ඕවිට, කොස්කුඹුරේ මඩකකාර සහ මඩකකාර දැනට කොස්කුඹුරේ වත්ත යනුවෙන් ප්‍රසිද්ධ ඉඩම බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. ඩී. එස්. ද සිල්වා විසින් සාදන ලද 1996 අප්‍රේල් මස 26 දිනැති අංක 3264/B දරන පිඹුරෙහි ලොට් 6 ලෙස සටහන් කර විස්තර කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල වන එකී ලොට් 6, උතුරට : ඇල සහ වික්‍රමරත්නට සහ වෙනත් අයට අයත් කුඹුර ද, නැගෙනහිරට : ලොට් 7 ද, දකුණට : ලොට් ආර්3 ද, බස්නාහිරට : ලොට් 5 ද, මායිම්ව පර්චස් පහලොවක (අ. 0, රූ. 0, පර්. 15) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි හතයි නවයයි හතරක (හෙක්ටයාර් 0.03794) වපසරියකින් යුක්ත වන අතර එකී අංක 3264/B දරන පිඹුර ප්‍රකාර එහි ඇති සියලු දේ ද වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C504/277හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී පරිදි ගෝනවල පිහිටි කොස්කුඹුර පාරේ, වරිපනම් අංක 40/15 දරන 'ගොරකගහවත්ත' නොහොත් දෙල්ගහවත්ත, දෙල්ගහකනත්ත, කොස්කුඹුරේ පිල්ලෑව, කොස්කුඹුරේ ඕවිට, කොස්කුඹුරේ මඩකකාර සහ මඩකකාර දැනට 'කොස්කුඹුරවත්ත' යනුවෙන් ප්‍රසිද්ධ ඉඩම ඉහත කී අංක 3264/බී දරන පිඹුරෙහි ලොට් 7 ලෙස සටහන් කොට දක්වා විස්තර කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල වන එකී ලොට් 7, උතුරට : වික්‍රමරත්නට සහ වෙනත් අයට අයිති කුඹුර ද, නැගෙනහිරට : ලොට් 8 ද, දකුණට : ලොට් R 3 ද, බස්නාහිරට : ලොට් 6 ද මායිම්ව පර්චස් පහලොවක (අ. 0, රූ. 0, පර්. 15) නැතහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි හතයි නවයයි හතරක (හෙක්ටයාර් 0.03794) වපසරියකින් යුක්ත වන අතර එකී අංක 3264/බී දරන පිඹුර ප්‍රකාර එහි ඇති අනෙක් සියළු දේ ද වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 504/278හි ලියාපදිංචි කර ඇත.

ඒ සමගම එයට දක්වා ඇති පාරේ අයිතිය ද ඇති අතර එනම්, ඉහත කී අංක 3264බී දරන ලොට් ආර් 3 ලෙස සටහන් කර ඇති (අඩි 15ක් පළල පාරට වෙන්කළ කොටස) බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. එස්. ද සිල්වා විසින් සාදන ලද අංක 3264A දරන පිඹුරෙහි ලොට් 2 (අඩි 10ක් සහ 15ක් පළල පාර) බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. එස්. ද සිල්වා විසින් සාදන ලද අංක 1441 දරන පිඹුරෙහි ලොට් 2 (අඩි 10ක් පළල පාරට වෙන්කළ කොටස) සහ බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. එස්. ද සිල්වා විසින් සාදන ලද අංක 1781 දරන පිඹුරෙහි ලොට් 7 (පාරට වෙන්කළ කොටස) ද වේ.

පී. පී. ජේ. වීරසිංහ,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
ග්‍රෑන්ඩ්පාස් ශාඛාව.

04-584

---

### රුහුණ සංවර්ධන බැංකුව - තංගල්ල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපළ 2009.06.08 වැනි දින පෙ. ව. 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### *උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය*

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවාපත්තුවේ, තංගල්ල නගර සීමාව තුළ මැදකැටිය කොට්ඨාසයේ දීපංකර පාරේ පිහිටි මහහේන නමැති ඉඩම බෙදාවෙන් කළ අංක 03 දරන කැබැල්ලෙන් බලයලත් මිනින්දෝරු හේමසිරි සිරිවර්ධන මහතා විසින් නැවත බෙදා වෙන් කළ අංක 1019 හා 1997.07.15 පිඹුරේ ප්‍රකාර අංක 04 දරන පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම සහ එහි පිහිටි සියළු වැවිලි සහ ගොඩනැගිලි ද සමග වේ.

ඉහත කී මැදකැටියේ පිහිටි මහහේන නමැති ඉඩම බෙදා වෙන් කළ ඉහත කී අංක 1019 පිඹුරේ දැක්වෙන ලොට් අංක 06 දරන පර්චස් නවයයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 9.4) විශාල බිම් තීරය පාරක් වශයෙන් පාවිච්චි කිරීමේ අයිතිය ද වේ.

වැඩි විස්තර සඳහා 2008.12.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.02.18 වැනි දින දිනමිණ, තිනකරන් හා දී අයිලන්ඩ් යන පුවත්පත්වල ද පළකර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- තංගල්ල තිස්ස පාරේ, මීටර් 850ක් ගියවිට මැදකැටිය පාර හමුවේ. එම පාරේ මී. 150ක් පමණ ගියවිට සුරුකුම් දේපළ හමුවේ.

*ගෙවීම් ක්‍රමය.*- වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය :-

01. ගැණුම් මිළෙන් 25%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ, අංක 382ඒ දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරිතුමාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාල මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209 සහ 047-2240631

ජී. පී. ආනන්ද,
සාම විනිසුරු, බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම,
මාතර.
දුරකථන අංකය : 041-2228731.

04-529/1

---

## රුහුණ සංවර්ධන බැංකුව - තංගල්ල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපළ 2009.06.04 වැනි දින පෙ. ව. 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, කුඩාවැල්ලේ පිහිටි මහවත්ත නමැති ඉඩම බලයලත් මිනින්දෝරු එල්. සේරසිංහ මහතා විසින් මැන සාදන ලද අංක 08ඒ හා 1996.08.21 දිනැති පිඹුරේ පෙන්වා ඇති ලොට් 1ඒ දරන පර්චස් විසිහතයි දශම හයයි හයක් (අ. 0 රූ. 0 පර්. 27.66) විශාල ඉඩම සහ එහි පිහිටි සියළු වැවිලි සහ ගොඩනැගිලි ද සමග වේ.

වැඩි විස්තර සඳහා 2008.12.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.02.18 වැනි දින දිනමිණ, තිනකරන් හා ද අයිලන්ඩ් යන පුවත්පත්වල ද පළකර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- කුඩාවැල්ල හන්දියේ සිට හුම්මාන පාරේ යනවිට හමුවන 03 වන බෝකොටුව අසල (ලංකා බැංකුවට ඉදිරිපිට) සුරැකුම් දේපළ පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය.*- වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය :-

01. ගැණුම් මිළෙන් 25%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ, අංක 382ඒ දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරිතුමාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාල මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209, 047-2240631

ජී. පී. ආනන්ද,
සාම විනිසුරු, බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම,
මාතර.
දුරකථන අංකය : 041-2228731.

04-529/2